ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>වසර **25**ක ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම - වෙළෙඳාමේ, **ආයෝජනයේ** සහ වර්ධනයේ මීළඟ රැල්ල බලගන්වමින්</u>

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉන්දු ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය (ILCCI) සමඟින් එක්ව ‘ වසර 25ක ඉන්දියා-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම - වෙළෙඳාමේ, ආයෝජනයේ සහ වර්ධනයේ මීළඟ රැල්ල බලගන්වමින්’ යන මැයෙන් සංවිධානය කළ වැඩසටහනක් 2026 ජූනි 23 වන දින කොළඹ දී පැවැත්විණ.

2. 2000 වසරේ සිට ක්‍රියාත්මක ඉන්දියා-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමට වසර 25ක් සපිරීම නිමිත්තෙන් මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ. ගිවිසුම බලාත්මක වූ දින සිට එය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික වෙළෙඳාමේ වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

3. ශක්තිමත් ද්විපාර්ශ්වික ආර්ථික සබඳතාවය පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රජයේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ, බස්නාහිර පළාත් ආණ්ඩුකාර ගරු හනීෆ් යූසුෆ් යන මහත්වරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්, ප්‍රධාන ව්‍යාපාරික මණ්ඩලවල නියෝජිතයන්, බුද්ධි මණ්ඩප සහ මාධ්‍ය ඇතුළු රැසක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.

4. ඉන්දු ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ සභාපති එම්. රාජූරාමන් මහතා සමාරම්භක දේශනය සිදු කළ අතර එහිදී එතුමා ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම නවීකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. එසේම, එතුමා ඉන්දියානු වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකීය සමාගම් සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් ඉන්දු ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය විසින් ගෙන ඇති ප්‍රයත්නයන් ද පැහැදිලි කළේය. මෙම අවස්ථාව ඇමතූ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා ඉන්දියාව සමඟ ද්විපාර්ශ්වික වෙළෙඳ සබඳතා තවත් ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් සහ නැගීඑන ව්‍යවසායකයන් සඳහා නව වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කිරීම සඳහා ගන්නා ප්‍රයත්නයන් ඉස්මතු කර

දැක්වීය. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය ගරු වසන්ත සමරසිංහ මහතා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දිගුකාලීන ආර්ථික හවුල්කාරිත්වය අගය කළ අතර ඉන්දියා වෙළෙඳ කවුළුව (India Trade Desk) ශ්‍රී ලාංකීය ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා ප්‍රධාන හැරවුම් ලක්ෂයක් වන බව සඳහන් කළේය. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශයේ උපදේශක දේවිකා ලාල් මහත්මිය සභාව අමතමින් ඉන්දියාවේ වර්ධනය ශ්‍රී ලංකාවට වාසිදායක වන බව ද එය භාණ්ඩ වෙළෙඳාම දෙගුණයකින් වර්ධනය වීම සහ ඉන්දියාව ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දෙවන විශාලතම වෙළෙඳපොළ බවට පත්වීම තුළින් පිළිබිඹු වන බව ද ප්‍රකාශ කළාය.

5. මෙම වැඩසටහන අතරතුරදී, ඉන්දු ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය විසින් සිය ඉන්දියා කවුළුව (India Desk) දියත් කරන ලද අතර එය ඉන්දීය වෙළෙඳ සහ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනයක් වන ග්ලෝබල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ට්‍රේඩ් ඇඩ්වයිසර්ස් (Global Investment and Trade Advisors - GITA) විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම කවුළුව තුළින් ශ්‍රී ලාංකික ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය නියාමන මඟ පෙන්වීම, ඉන්දියානු වෙළෙඳපොළ පිළිබඳ වැදගත් කරුණු සහ ඉන්දීය පාර්ශ්වකරුවන් සමඟ ව්‍යුහාත්මක නියැලීමේ අවස්ථා ලබා දෙනු ඇත.

6. ඉන්දියා කවුළුව සමාරම්භ කිරීමතේ අනතුරුව විද්වත් මණ්ඩල සාකච්ඡාවක් ද පැවති අතර එහිදී, පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. මෙම විද්වත් මණ්ඩල සාකච්ඡාව කර්මාන්තයේ ප්‍රවීණයන්ට සහ බුද්ධි මණ්ඩප සාමාජිකයන්ට විවිධ අදහස්, වටිනා කරුණු කාරණා සහ අන්දැකීම් හුවමාරු කර ගැනීමට වේදිකාවක් විය.

7. මෙම වැඩසටහන තුළින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශක්තිමත් ද්විපාර්ශ්වික ආර්ථික හවුල්කාරිත්වය සහ ව්‍යවසායකත්ව සහයෝගීතාවයන්, සැපයුම් දාම හවුල්කාරිත්වයන් සහ ආයතනික යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම හරහා මෙම සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා දෙරටෙහිම පොදු අභිලාෂය අවධාරණය කරන ලදී.

***

**කොළඹ**

***2026* ජූනි *24***